චක්‍රලේඛ අංක: 03/2017

සමුපකාර සේවක කොමිෂන් සභාව (බ.ප.)
අංක : 109, 4 වන මහල,
මහා වීදිය,
බත්තරමුල්ල.
2017-03-31

බස්නාහිර පළාතේ සියළුම විවිධ සේවා සමුපකාර සමිති,
දිස්ත්‍රික් ග්‍රාමීය බැංකු සංගම්, සණස සමිති, දිස්ත්‍රික් සමුපකාර මණ්ඩල හා
අනෙකුත් සියළුම ලියාපදිංචි සමුපකාර සමිති සභාපතිවරුන් වෙත,

**බස්නාහිර පළාත් සමුපකාර සමිතිවල තාවකාලික, අනියම් පදනම මත**
**බඳවාගත් සේවකයින් ස්ථිර කිරීම.**

බස්නාහිර පළාතේ ඇතැම් සමුපකාර සමිති සඳහා සේවකයින් බඳවා ගැනීමේ දී සමුපකාර කොමිෂන් සභා රෙගුලාසි අනුගමනය නොකරමින් අවිධිමත් ලෙස බඳවාගැනීම් සිදු කිරීම හේතුවෙන් එම තනතුරු දරණ සේවකයින් තම තනතුරුවල ස්ථිරත්වයට පත්වීමට නොහැකිව බලවත් අපහසුතාවයන්ට මුහුණ දෙන අතර, සේවකයින් මෙබඳු තත්ත්වයන්ට මුහුණ දීමට සිදුනොවන අන්දමින් අධ්‍යක්ෂ මණ්ඩලය ක්‍රියා කළයුතු බවට තරයේ දැනුම්දීමට කොමිෂන් සභාවට සිදුව ඇත.

සමුපකාර සේවක කොමිෂන් සභා චක්‍රලේඛ අංක: 02/2010 හි තනතුරු වර්ගීකරණය අනුව, **කණිෂ්ඨ සහ මෙහෙයුම් මට්ටමේ තනතුරු** සඳහා තාවකාලික හා අනියම් පදනම මත එසේ අවිධිමත් ආකාරයට බඳවා ගනු ලැබ සිටින සේවකයින් පහත සඳහන් සුදුසුකම් සපුරන්නේ නම්, ඔවුන්ගේ පත්වීම් අනුමත කිරීමට මෙම කොමිෂන් සභාව විසින් තීරණය කර ඇති අතර, ඒ සඳහා අවශ්‍ය විධිවිධාන සැලසීම මෙම චක්‍රලේඛයෙහි අරමුණ වන්නේය.

02. ඒ අනුව, පහත සඳහන් සුදුසුකම් හා කොන්දේසි සම්පූර්ණ කරනු ලබන සියළුම තාවකාලික හා අනියම් සේවක පත්වීම් අනුමත කර ගැනීමට කටයුතු කළ යුතු වන අතර, ඒ සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සඳහා, මේ සමඟ අමුණා ඇති, coopec 1 ආකෘතිපත්‍රය සහ එම ආකෘතිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු ඇමුණුම් ලිපිලේඛන සමඟ ඔබගේ ඉල්ලීම**, 2017.07.31** දිනට පෙර මෙම කොමිෂන් සභාව වෙත ලැබීමට සැලැස්විය යුතු බව කාරුණිකව දන්වා සිටිමි.

i. වලංගු පිරිස්බල තක්සේරුව අනුව අනුමත සේවක සංඛ්‍යාවේ පුරප්පාඩු තිබිය යුතුය.

ii. අනුමත සේවක සංඛ්‍යාවට අයත්, දැනට පුරප්පාඩුව පවත්නා තනතුරෙහි 2016.12.31 දිනට (වැඩකරන) අවම දින 180 ක සතුටුදායක ලෙස හා අඛණ්ඩව සේවය කර තිබිය යුතු අතර, තනතුරට අදාල සුදුසුකම් සපුරා තිබිය යුතුවේ. නිවාඩු දින වශයෙන් ප්‍රකාශයට පත් කර ඇති දිනයන්හි ද සේවය කළ යුතු තනතුරක සේවය කරන නිලධාරියෙකු එම දිනයන්හි දී සේවය කළ දින ප්‍රමාණය ද මෙම දින 180 ගණනය කිරීමේ දී අදාළ කර ගත යුතු වේ.

iii. තනතුරුවලට බඳවාගැනිමේදී එම තනතුරුවලට අදාල අනුමත සුදුසුකම් සපුරා නැතිනම් අදාල සමිතියේ එම තනතුරේ අවු.03ක අඛණ්ඩව සතුටුදායක (2016.12.31 දිනට) තාවකාලික හෝ අනියම් පදනමින් සේවය කර ඇති සේවකයින් මෙම චක්‍රලේඛය අනුව ස්ථිර කළ හැකිය.

iv. මෙම චක්‍රලේඛය යටතේ ස්ථිර කිරීමට සුදුසුකම් ලබන සේවකයින්ගේ වයස 2016.12.31 දිනට අවු.45 ඉක්මවා තිබුණ ද, ඔවුන් තාවකාලික, අනියම් පදනම මත බඳවා ගන්නා අවස්ථාවේ වයස අවු.45 ඉක්මවා නොතිබුණේනම් මෙම චක්‍රලේඛය යටතේ ඔවුන්ගේ පත්වීම් අනුමැතියට ඉදිරිපත් කළ හැකිය.

v. ආකෘතිපත්‍රය සමඟ පහත සඳහන් ලිපිලේඛන මෙම කොමිෂන් සභාව වෙත ලැබීමට සැලැස්විය යුතුය.

- අදාළ සේවකයින් ස්ථිර කිරීම පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය/ කාරක සභා තීරණය
- තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීමට සමුපකාර සංවර්ධන කොමසාරිස් /සමිති රෙජිස්ට්‍රාර්ගේ අනුමැතිය හෝ වසර 03ක කාලයක් නොඉක්මවූ පිරිස්බල තක්සේරුවේ සහතික කළ පිටපතක්
- ඇමුණුම අංක 01 – (අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සනාථ කෙරෙන සහතිකවල සහතික කළ පිටපත්, උප්පැන්න සහතිකයේ සහතික කළ පිටපතක්, ජාතික හැඳුනුම්පතෙහි සහතික කළ පිටපතක්, බඳවාගැනීමේදී සමිතිය විසින් නිකුත් කරන ලද පත්වීම් ලිපියේ සහතික කළ පිටපතක්)
- සමිතිය පිහිටි දිස්ත්‍රික්කය තුළ / බස්නාහිර පළාත තුළ වසර 02 කට වැඩි කාලයක් සඳහා ස්ථිර පදිංචිය තහවුරු කෙරෙන, ග්‍රාම නිලධාරී සහතිකය.
- වැඩ, පැමිණීම හා හැසිරීම පිළිබඳ කාර්යය සාධන වාර්තාවක්

03. සේවකයින් බඳවා ගැනීමේ දී 2016.12.31 දිනට පෙර බඳවාගෙන ඇතත් මෙම චක්‍රලේඛය මඟින් අවශ්‍ය සේවා කාලය සම්පූර්ණ කරගත නොහැකිව ස්ථිර කිරීමට නොහැකි වන සේවකයින් සඳහා තවත් වසරක අඛණ්ඩ සේවා කාලයක් සේවය කිරීමෙන් පසුව සමිතිය විසින් අදාල ඉල්ලීම මෙම කොමිෂන් සභාව වෙත එවීමට කටයුතු කළ හැකිය.

04. 2016.12.31 දිනෙන් පසුව බඳවාගන්නා ලද කිසිදු සේවකයෙක් මෙම චක්‍රලේඛය යටතේ පත්වීම් අනුමත කිරීමට සුදුසුකම් නොලබන අතර, සමුපකාර සේවක බඳවාගැනීමේ පරිපාටියේ සුදුසුකම් යටතේ සම්මුඛ පරීක්ෂණයකින් අනතුරුව ඔවුන්ගේ පත්වීම් අනුමත කිරීමට පියවර ගත යුතුය. එමෙන්ම, 2017-07-31 දිනට පසුව එවනු ලබන ඉල්ලීම් සලකා නොලබන බව ද අවධාරණය කර දන්වා සිටිමි.

කොමිෂන් සභා නියමය පරිදිය.

එස්. ඒ. එල්. රංගනී,
ලේකම්,
සමුපකාර සේවක කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

පිටපත් :

I. ප්‍රධාන ලේකම්, බස්නාහිර පළාත.
II. ලේකම්, සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය, බස්නාහිර පළාත.
III. සමුපකාර සංවර්ධන කොමසාරිස්/සමිති රෙජිස්ට්‍රාර්, බස්නාහිර පළාත.
IV. සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස්(කොළඹ/ගම්පහ/කළුතර)
V. අධ්‍යක්ෂ, බස්නාහිර පළාත් සමුපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය.
VI. ලේකම්, මධ්‍යම රජයේ සමුපකාර සේවක කොමිෂන් සභාව.
VII. සියළුම පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා ලේකම්වරුන්.
VIII. සියළුම වෘත්තීය සමිති සංගම්

**03/2017 චක්‍රලේඛය යටතේ සමුපකාර සේවකයින් ස්ථිර කිරීමේ අයදුම්පත්‍රය**

පළමු කොටස

i. නිලධාරියාගේ සම්පූර්ණ නම :
........................................................................................................................................................................................

ii. තනතුර :
........................................................................................................................................................................................

iii. මුලින්ම සේවයට බඳවා ගනු ලැබූ දිනය : ........................................................................................................................

iv. උපන්දිනය : ........................................................................................................................
(මුලින්ම සේවයට බඳවාගන්නා දිනට වයස අවු.45 නොඉක්මවිය යුතුය.)

v. ස්ථිර ලිපිනය :
........................................................................................................................................................................................
........................................................................................................................................................................................

(බස්නාහිර පළාතේ වර්ෂ 02ක ස්ථිර පදිංචිය තහවුරු විය යුතුය.)

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, .............................. දින සිට මේ දක්වා ......................................................................... සමුපකාර සමිතියේ ................................... තනතුරෙහි අඛණ්ඩ වර්ෂ .................... මාස .................... ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති බවත්, මට විරුද්ධව කිසිදු විනයානුකූල ක්‍රියාමාර්ගයක් මේ දක්වා ගෙන නැති බව සහ, මාගේ දැනීමේ හැටියට කිසියම් විනය ක්‍රියාමාර්ගයක් ගැනීමට නියමිතව නොමැති බවත් සහතික කොට ප්‍රකාශ කරමි.

................................... ...............................
දිනය නිලධාරියාගේ අත්සන

දෙවන කොටස

i. ඉහත පළමු කොටසේ සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවට සෑහීමකට පත් වෙමි.

ii. ...................................................................... මයා/ මිය/ මෙනවිය, ................. දින සිට මේ දක්වා, මෙම සමුපකාර සමිතියේ .......................................... තනතුරෙහි අඛණ්ඩ වර්ෂ ............... මාස ............. ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇත.

iii. මෙම සේවා කාලය තුළ ඔහු/ ඇය විසින් වැටුප් රහිත නිවාඩු දින ....................ක් ලබා ගෙන ඇත.

iv. ඔහුට/ ඇයට විරුද්ධව කිසියම් විනයානුකූල ක්‍රියාමාර්ගයක් ගැනීමට නියමිතව ඇත්නම් ඒ පිළිබඳ විස්තර :
........................................................................................................................................................................................
........................................................................................................................................................................................

......................................................................................... මයා/ මිය/ මෙනවිය මීට පෙර කිසිදු ආකාරයකින් කොමිෂන් සභාවේ අනුමත සේවකයෙකු නොවන බවත්, පිරිස්බල තක්සේරුව අනුව මෙම පත්වීම ......................... දින සිට ස්ථිර කිරීමට පිරිස් බල තක්සේරුව අනුව ප්‍රතිපාදන ඇති බවත්, එමගින් අනෙකුත් නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨතාවයට හානියක් සිදු නොවන බවට සෑහීමකට පත් වන බවත්, ඔහු/ ඇය .............................. චක්‍රලේඛයේ සඳහන් විධිවිධානවලට යටත්ව ................................ දින සිට ..................................... තනතුර සඳහා පත් කිරීම සුදුසු බවත්, පහත සඳහන් ලියකියවිලි මේ සමඟ ඉදිරිපත් කර ඇති බවත් සහතික කරමි.

i. ඇමුණුම 01 ආකෘතිය
ii. පිරිස්බල තක්සේරුව
iii. උප්පැන්න සහතිකය (සහතික කළ සත්‍ය පිටපත)
iv. ග්‍රාම නිලධාරී සහතිකය
v. අධ්‍යාපන සහතික (සහතික කළ සත්‍ය පිටපත්)
vi. මුල් බඳවා ගැනීමට අදාල අධ්‍යක්ෂ මණ්ඩල තීරණය සහ බඳවාගැනීමේදී සමිතිය විසින් නිකුත් කරන ලද පත්වීම් ලිපිය
vii. වැඩ පැමිණීම,හැසිරීම පිළිබඳ කාර්ය සාධනය
viii. 03/2017 චක්‍රලේඛය යටතේ ස්ථිර කිරීමට අදාල අධ්‍යක්ෂ මණ්ඩල තීරණය /කාරක සභා තීරණය

දිනය: මානව සම්පත් කළමනාකරු

දිනය: සාමාන්‍යාධිකාරී

දිනය: සභාපති